# රුහුණ විශ්ව විද්‍යාලය

## සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව -2024/2025
## Master of Development Planning
## (SLQF 9 මට්ටම)

රුහුණ විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨය මගින් මෙහෙයවනු ලබන ඉහත උපාධි පාඨමාලාවේ දෙවන කණ්ඩායම සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

**01. පාඨමාලාවේ ලියාපදිංචියට අවශ්‍ය අවම සුදුසුකම්**

I. පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජීය විද්‍යා විෂය ශික්ෂණයක්/ශික්ෂණයන් නියෝජනය කරමින් ලබා ගත් පළමු උපාධිය (SLQF 06 වෙනි මට්ටම/ විශේෂ උපාධිය **හෝ** SLQF 05 වෙනි මට්ටම/සාමාන්‍යවේදී උපාධිය)

II. සාමාජීය විෂය ශික්ෂණයන් නියෝජනය කරමින් අර්ස 30 ඇතුලත්වන පරදි, පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඕනෑම විෂය ශික්ෂණයක් මූලිකව නියෝජනය කරමින් ලබා ගත් පළමු උපාධිය (SLQF 06 වෙනි මට්ටම/ විශේෂ උපාධිය හෝ SLQF 05 වෙනි මට්ටම/සාමාන්‍යවේදී උපාධිය)

III. අදාළ අධ්‍යන මණ්ඩලය (BOS) විසින් තීරණය කරනු ලබන සහ රුහුණු විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාව විසින් අනුමත කරන ලද සංවර්ධන සැලසුම් ක්ෂේත්‍රයේ NVQ මට්ටම 7 සම්පූර්ණ කිරීම

IV. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඕනෑම විෂය ශික්ෂණයක් මූලිකව නියෝජනය කරමින් ලබා ගත් පළමු උපාධිය (SLQF මට්ටම 06/SLQF මට්ටම 05) හෝ NVQ මට්ටම 7 සමග අදාළ අදාළ අධ්‍යන මණ්ඩලය (BOS) විසින් සහ රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් අනුමත කරන ලද, පිළිගත් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය හෝ සංවර්ධන සැලසුම්වලට අදාළ පුද්ගලික ආයතනවල කළමනාකරණ මට්ටමින් වසර 2 ක සේවා පළපුරුද්දක් තිබීම

- **දේශන පැවැත්වීම : සෙනසුරාදා පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා**
- **අයදුම්පත් භාර ගන්න අවසන් දිනය : 2024 අගෝස්තු 31**
- **දේශන මාධ්‍ය : සිංහල/ ඉංග්‍රීසි**
- **පාඨමාලාවේ කාල සීමාව : අධ්‍යන වර්ෂ එකක් හෙවත් සමාසික දෙකකි**
- **පාඨමාලා ගාස්තු : රු. 150,000.00**

**02. අයදුම්පත් ලබා ගැනීම**

අයදුම්පත් ලබා ගැනීම සඳහා රු.2000/-ක මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවකින් යොමු අංක 322232500000013 (ගිණුම් අංකය ලෙස භාවිතා කරන්න) යටතේ රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස් කිරීමේ ගිණුමට බැරවන සේ ගෙවා ලබා ගත් ලදුපතෙහි පිටුපස පාඨමාලාවේ නම සහ අයදුම්කරුගේ ලිපිනය පැහැදිලිව සඳහන් කර රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වේ. අයදුම්පත් තැපෑලෙන් ලබා ගැනීමට තමන්ගේ නම හා ලිපිනය ලියූ රු. 110/- ක මුද්දර ඇලවූ 9”×4” ප්‍රමාණයේ ලිපි කවරයක් සමඟ පෙර කී පරිදි රු.2000/- ගෙවා ලබා ගත් ලදුපත **නියෝජ්‍ය ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, නො.115, ශ්‍රී ධර්මාරාම මාවත, කොටුව, මාතර** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2024 අගෝස්තු 20** දිනට පෙර එවිය යුතුය.

සම්පූර්ණ කළ අයදුම්පත් **2024 අගෝස්තු 31 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් නියෝජ්‍ය ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, නො.115, ශ්‍රී ධර්මාරාම මාවත, කොටුව, මාතර.** යන ලිපිනයට එවිය යුතුය. ලිපියේ වම්පස ඉහළ කෙළවරේ **“ සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව ”** ලෙස සඳහන් කළ යුතුය.අයදුම්පත් බාගත කර ගැනීම (Download) සිදුකළ හැකිය. (මේ සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ වෙබ් අඩවිය www.fgs.ruh.ac.lk වෙත පිවිසෙන්න.)

**ලේඛකාධිකාරී, රුහුණ විශ්වවිද්‍යාලය.**
**2024.07.23**

tamilguru.lk